**<u>දිවුලපිටිය ප්‍රාදේශීය සභාව</u>**
**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 26 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**.

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකරන ලද රු.6,059,428 ක් වූ ව්‍යාපෘති 04 ක වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති 04 කින් වර්ෂය තුළ ලබාගත් අත්තිකාරම් මුදල් ශේෂය අඩුකිරීමකින් තොරව මුළු ව්‍යාපෘති වටිනාකම ණය ගැතියන් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ණයගැති ශේෂය රු392,000 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඇ) අවලංගුකර ඇති බඩල්ගම ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගිණුම්ගත කර තිබූ රු.4,371,890 ක ණයගැති ශේෂය ගැලපුම් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ණයගැතියන් රු.4,371,890 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) කොටදෙනියාව ආදාහනාගාරයේ තීන්ත ආලේප කිරීමේ වියදම වූ රු.15,490 ක් ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඉ) 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී නිරීක්ෂණය කරන ලද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලද උපකරන වල වටිනාකම අගය කර 2015 වර්ෂයේදීද ස්ථාවර වත්කම්වලට ගෙන නොතිබුණි.

( ඊ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලද ස්ථාවර තැන්පතු පොලී රු.127,377 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

රු.155,818,668 ක් වටිනා ගිණුම් විෂයයන් 5 ක් සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීම්, ලේඛන හා උප ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.19,310,290 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.30,736,777 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 177 ප්‍රකාරව එකතු කර ගන්නා ආදායම එදිනම හෝ හැකි ඉක්මනින් බැංකුගත කළ යුතු වුවත් රු.24,426 ක මුදලක් දේපළ තහනම් කරන නිලධාරියා විසින් දින 10 සිට මාස 2 ක කාලයක් ප්‍රමාද වී සභාවට ලබාදී තිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.119,062 ක් වූ අගරු චෙක්පත් ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.15,500,000 ක් වූ ස්ථාවර තැන්පතු මුදල් සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරිය විසින් සභා අනුමැතියකින් හා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව 2015 පෙබරවාරි හා මාර්තු මාසවලදී මුදල් කරගෙන තිබූ අතර මෙම මුදල් 2014 වර්ෂයේ සිදු කරන ලද මුදල් ප්‍රතිපූර්ණය නොවූ ව්‍යාපෘතිවලට ගෙවීම සඳහා යොදවා ගෙන තිබුණි.

2.3 **<u>ආදායම් පරිපාලනය</u>**

2.3.1 **<u>ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම්</u>**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 6,170 | 6,105 | 2,681 |
| බදුකුලී | 2,085 | 1,627 | 3,800 |
| වෙළඳ බලපත්‍ර | 293 | 294 | 38 |
| | 8,548 | 8,026 | 6,519 |

ඉහත කරුණු අනුව හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

2.3.2 **<u>වරිපනම් හා බදු</u>**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ විධිවිධාන අනුව දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් 2007 පෙබරවාරි 09 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 1484 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර තිබුණි. වරිපනම් බදු සඳහා දැනට ක්‍රියාත්මක වන්නේ 1993 හා 2003 යන වර්ෂයන්හිදී සිදුකරන ලද තක්සේරු ප්‍රතිශෝධනයන් වන හෙයින් නව තක්සේරු ප්‍රතිශෝධනය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තිය ප්‍රකාර ප්‍රධාන අමාත්‍ය හා විෂයභාර අමාත්‍යවරයාගෙන් ලැබී ඇති අනුමැතිය 2013 මාර්තු 28 දින මහා සභාවේ දී පිළිගෙන තිබුණි. ඒ අනුව නව වරිපනම් බදු තක්සේරුව සඳහා දිවුලපිටිය උප කාර්යාලයේ වරිපනම් ඒකක 25000 ක දේපල හඳුනා ගෙන තිබූ අතර, කොටදෙණියාව හා කෙහෙල්ඇල්ල (බඩල්ගම) උප කාර්යාලවල දේපල හඳුනා ගැනීම 2015 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) වරිපනම් බදු තක්සේරු කිරීම ක්‍රියාත්මක ව්‍යාපෘති කාල සීමාව 2014 අගෝස්තු 01 සිට 2015 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබූ නමුත් 2015 දෙසැම්බර් 31 වන විටත් තක්සේරු කිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 2,681,508 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂය තුළ වසර 5 ඉක්මවූ ශේෂය රු.1,699,951 ක් විය.

(ඈ) දිවුලපිටිය උප කාර්යාලයට අයත් ව්‍යාපාර 11 ක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කරවා නොගෙන පුද්ගලික තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කරවාගෙන තිබුණි.

(ඉ) 2007 පෙබරවාරි 09 දිනැති අංක 1484 දරන ගැසට් නිවේදනය මගින් දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇතත් ඒ අනුව වරිපනම් බදු අයකර ගැනිමට කටයුතු කර නොතිබූ අතර 1990 ගැසට් නිවේදනය පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි.

2.3.3 **බදුකුලී**

(අ) 1999 වර්ෂයේ සිට පැවත එන වෙළඳසැල් හා පොල බදු රු.792,214 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. එමෙන්ම පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත කඩ කාමර කුලී රු.182,685 ක්ද, බදුකර කුලී රු.55,083 ක් ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කර ඇතත් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006,2007 වර්ෂවල සිට අයකර නොගත් බදුකර කුලී ශේෂය රු.2,433,647 ක් විය.

2.3.4 **උසාවි දඩ**

2012, 2013 වර්ෂ සඳහා මීගමුව බල ප්‍රදේශයට අයත් උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 **මුද්දර ගාස්තු**

2015 වර්ෂයට අදාළ හා 2014 වර්ෂයට අදාළව මුද්දර ආදායම් මීගමුව, අත්තනගල්ල, ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

3.1 **වත්කම් කළමනාකරණය**

**නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) දිවුලපිටිය සතිපොළ භූමියේ අළුතින් ඉදිකරන ලද අංක17,18,19,20 දරන ඉහළ මහලේ කඩ කාමර හතර 2015 නොවැම්බර් මාසය දක්වාත් බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා භූමිය තුළ වසර ගණනාවක සිට රදවා ඇති අබලි භාණ්ඩ ඉවත් කිරීමට සභාව විසින් නිසි පියවර ගෙන නොතිබුණි.

(ඇ) සභාව සතු අත් ට්‍රැක්ටරයක් 2003 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවති අතර, අළුත්වැඩියාවක් හෝ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සභා පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් පවතින බව 2016 අප්‍රේල් 28 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) 2015 සමීක්ෂණ වාර්තාව අනුව සභාව සතු වටිනාකම රු.130,438 ක්වූ පොදු ළිං 16 ක් භාවිතා නොකර පැවතුණි.

3.2 **ආර්ථික නොවූ ගනුදෙනු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ ජූලි මාසය දක්වා සභාවට ආසන්නයේ පිහිටි ආයතනයෙන් මිලදී නොගෙන වෙනත් ආයතනයකින් වැඩි මිලකට ලිහිසි තෙල් හා අනෙක් තෙල් වර්ග ලබා ගැනීම නිසා රු.11,150 ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි.

(ආ) බැකෝ ලෝඩරය සඳහා පෞද්ගලික රක්ෂණ සමාගමකින් රු.110,011 කට පූර්ණ රක්ෂණයක් ලබා ගෙන තිබූ අතර මේ සඳහා රු. 95,570 ක් වූ අවම මිල ගණන් ඉදිරිපත්කළ සමාගමෙන් රක්ෂණය ලබානොගැනීම සහ රජයේ රක්ෂණ ආයතන තිබියදී පෞද්ගලික රක්ෂණ සමාගමකින් රක්ෂණය ලබාගැනීමට තුඩුදුන් හේතූන් විගණනයේදී පැහැදිලි නොවීය.

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

3.3.1 **ව්‍යාපෘති ප්‍රගතිය**

2015 වර්ෂයේ සභාවට සංවර්ධන ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති 267 ක් අනුමත වී තිබූ අතර කර්මාන්තවල ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 දිනට පහත පරිදි විය.

(අ) ගම් නගා සිටුවීමේ දින 100 වැඩ සටහන යටතේ ව්‍යාපෘති 21 ක වැඩ 2015 දෙසැම්බර් 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි. සභාවට අයත් නොවන ඉඩම්වල සංවර්ධන කටයුතු කිරීමට අවසර දීම නිසා මෙවැනි තත්ත්වයක් ඇතිවූ බව ලේකම් විසින් මා වෙත දන්වා එවා තිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 27 දිනැති අංක 452 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාර කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේ අදාළ ප්‍රජා පාදක සංවිධානය කොන්ත්‍රාත් තුනකට වැඩි ප්‍රමාණයක නිරත වී නොසිටියයුතු බව දක්වා ඇතත් එකී සීමාව ඉක්මවා කොන්ත්‍රාත් කටයුතු සිදුකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යටතේ කොටදෙණිය උප කාර්යාලය අදාලව ව්‍යාපෘති 14 ක්ද, කෙහෙල්ඇල්ල කාර්යාලය ට අදාළව ව්‍යාපෘති 26 ක්ද, දිවුලපිටිය කාර්යාලයට අදාළව ව්‍යාපෘති 22 ක්ද, වශයෙන් ව්‍යාපෘති 62 ක් අනුමත වී තිබුණු අතර, සභා අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් එයින් ව්‍යාපෘති 25 ක වැඩ කර නොතිබුණි.

3.3.2 **හල්පෙ බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

මේ සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 29 දින කළ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) ව්‍යාපෘතියට අදාළ ගොඩනැගිලි සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) 2014 නොවැම්බර් 28 දින මහා සභාවේදී මෙම ව්‍යාපෘතිය අනුමත වී ඇති අතර, එදිනම දින 32 ක් ඇතුළත ව්‍යාපෘතිය නිම කර භාරදීමේ පොරොන්දුව මත කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමට එළඹී තිබුණද, වැඩ අවසන් කර තිබුණේ 2015 අගෝස්තු මස 03 දින විය.

(iii) ව්‍යාපෘතිය භාර දීමේදී සමිතියේ මූල්‍යමය හැකියාව පිළිබඳ පරීක්ෂා කළ බව නිරීක්ෂණය නොවූ අතර මූල්‍ය හිඟතාවය නිසා වැඩ ප්‍රමාද වන බව 2015 අගෝස්තු 13 දිනැති ලිපිය මගින් කොන්ත්‍රාත්කරු විසින් දන්වා එවා තිබුණි.

(iv) නැවත අනුමත කළ වැඩ සඳහා 2015 ජූනි 15 දින ගිවිසුම් අත්සන් කර මාස 03 ක කාල සීමාවක් ලබාදී තිබූ නමුත් එම වැඩ ප්‍රමාණය අවසන් කර තිබුණේ 2015 නොවැම්බර් මස 26 දින විය.

(v) මිනුම් වාර්තාවල ඡායා පිටපත් ඉදිරිපත් කර තිබූ අතර ඒවා පැහැදිලි නොවීය.

(vi) මෙම ගොඩනැගිල්ල භාවිතයට යෝග්‍ය මට්ටමකට නොතිබූ බවත් ව්‍යාපෘතියෙන් කොටසක් පමණක් අවසන් කර ඇති බවත් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.3.3 **<u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් නැගුම වැඩසටහන යටතේ රු.5,000,000 ක් වටිනාකම වූ අස්වැන්නවත්ත බටහිර ගල් කන්ද සතිපොළ නවීකරණය කිරීමේ වැඩ කටයුතු 2015 සැප්තැම්බර් 15 දින වනවිට අවසන් කළ යුතු බවට උපදෙස් දී තිබුණද, 2015 දෙසැම්බර් මාසය දක්වාත් නිමකර තිබුණේ සියයට 60 ක ප්‍රමාණයක් පමණි.

(ආ) පළාත් නැගුම වැඩ සටහන යටතේ අස්වැන්නවත්ත පේෂ කර්මාන්ත මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ පළමු ගෙවීම තුල මිනුම් පත්‍රිකා තාක්ෂණ නිලධාරීන් අනුමතකර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය 2015 සැප්තැම්බර් 15 දිනට නිම කළ යුතු බව දක්වා තිබූ නමුත් විගණන දිනය වූ 2016 මැයි 03 දින වන විටත් නිම කර නොතිබුණි. මීට අමතරව ව්‍යාපෘතියට අදාල කාර්ය සාධන බැඳුම්කරයෙහි වලංගු කාලය අවසන් වී තිබූ නමුත් කාලය දීර්ඝ කළ බවට කිසිදු සාක්ෂියක් ලිපි ගොනුවේ ඇතුළත්ව නොතිබුණි.

3.4 **<u>මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කෙහෙල් ඇල්ල, කොටදෙණියාව, දිවුලපිටිය උප කාර්යාල සතුව සම්ප්‍රේෂණ කුළුණු 38 ක් පැවති අතර එම කුළුණු සඳහා ගාස්තු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදීද සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වෙන්දේසි ඉඩම් දෙකකින් සභාවේ පොදු පහසුකම් සඳහා වෙන්කර තිබූ ඉඩම් කොටස්වල හිමිකම් ඔප්පු ලබාගෙන ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට පැවත එන රු.2,584,363 ක වැරදි බිල් කිරීම් වටිනාකම 2015 දෙසැම්බර් දක්වාත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.26,053,880 ක් වූ සේවක ණය හා අත්තිකාරම් ශේෂය තුළ ඇතුලත් එකතුව රු.2,767,965 ක් වූ අත්තිකාරම් ශේෂයන් 6 ක් වර්ෂ ගණනාවක සිට ගිණුම්වල ඉදිරියට එමින් පැවතුණ අතර ඒවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. මීට ඇතුලත් රු.2,558,617 ක් වූ ඉන්ධන අත්තිකාරම් ශේෂය 2008 වර්ෂයේ සිට පවතින ශේෂයක් විය.

3.5 **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දිනකට ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 5-6 ක් වන අතර තෝරන ලද කසළ ටොන් 2-3 පමණ නාවාන කොම්පෝස්ට් අංගනය මගින් කාබනික පොහොර බවට පත්කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී කසළ අපහරණය සඳහා සභාව විසින් රු.3,063,864 ක වියදමක් දරා තිබුණි.

(ආ) නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබූ අතර සම්පූර්ණ බල ප්‍රදේශය ආවරණය වන පරිදි කසළ වර්ග කර ලබා ගැනීම සඳහාත් නිසි පියවරගෙන නොතිබුණි.

(ඇ) 2011 ජූලි 05 දිනැති අංක 1713/ 11 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 22 වගන්තිය ප්‍රකාරව සඳහන් කර ඇති කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම කෙරෙහි සභාව පියවර ගෙන නොතිබුණි.

## 3.6 පාරිසරික ගැටළු

සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසය දක්වා සභාව වෙත මහජන පැමිණිලි 43 ක් ලැබී තිබූ අතර, එයින් පැමිණිලි 19 ක් සභාපති හා වැඩ අධිකාරි වෙත යොමු කළ බව ලේඛනයේ සඳහන් කර තිබුණි. 2013 සහ 2014 වර්ෂවල ඉදිරිපත්කර තිබූ පැමිණිලි 84 ක් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර මහජන පැමිණිල්ලක් ලැබූ අවස්ථාවේ සිට අවසානය දක්වා ඒ වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය පිළිබඳ කිසිදු තොරතුරක් පැමිණිලි ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 03 | 02 | 01 |
| ද්විතියික | 40 | 38 | 02 |
| ප්‍රාථමික | 141 | 126 | 15 |
| | 184 | 166 | 18 |

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් පරීක්ෂක තනතුරු දෙකක් 2011 අප්‍රේල් මාසයේ හා 2015 අප්‍රේල් මාසයේ සිට පුරප්පාඩුව පැවති අතර, අධිකරණමය කටයුත්තක් හේතුවෙන් බඳවා ගැනීම් සිදු නොකරන ලෙස පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දන්වා එවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව තුළ රාජකාරි පැවරීමේදී වැඩ බෙදීමේ කටයුතු විධිමත් ලෙස සිදුකර නොතිබුණි.

(ඇ) පුහුණු අවශ්‍යතා හඳුනාගෙන සේවකයන් පුහුණු කරවීමට සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

( ඈ) ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ සේවක සුභසාධන කටයුතු අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය